// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,495 - 2026 ජුනි මස 26 සිකුරාදා - 2026.06.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 2764 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... ... | 2779 |


*සැ.යු.*: (i) අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2026 ජුනි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2026 ජුනි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 17 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 03 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2761 - B 82804 - (2026/06)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ෴ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඒ‘‘

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (දෙමළ) රෙජිස්ට්‍රාර් තනතුරු

**අම්පාර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැළකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.
මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 ජූලි මස 27** දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජුනි මස 04 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | අඩ්ඩාලච්චේන | තයිකානගර් කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| අම්පාර | කල්මුනේ | කරවාහුපත්තු කල්මුනේකුඩි කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| අම්පාර | කල්මුනේ | කරවාහුපත්තු අක්බර් ආදර්ශ ගම්මාන කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| අම්පාර | පොතුවිල් | පොතුවිල් (පසරිච්චේන) කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| අම්පාර | සම්මන්තුරේ | සම්මන්තුරේ 1, 2 කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| අම්පාර | කල්මුනේ | කරවාහුපත්තු කොට්ඨාසයේ නට්පිට්ටිමුණෙෙ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

06 - 321

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

**අම්පාර දිස්ත්‍රික්කය**

**(දෙමළ මාධ්‍යය)**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.
රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර්ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 ජූලි මස 27 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජුනි මස 04 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

***උපලේඛනය***

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | අම්පාර | අම්පාර නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

06 - 322

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල 'ක්වාසි' තනතුරු සඳහා ක්වාසි විනිසුරුවරුන් පත්කිරීම - 2026

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්හට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥවරයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරු ඉස්ලාම් ආගම පිළිබඳ මනා දැනුමක් ඇති, වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ හා දික්කසාද පනත හා ඉස්ලාම් නීතිය පිළිබඳ විශේෂිත වූ මනා දැනුමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙකු විය යුතු ය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

ක්වාසිවරයෙකු තමා පත් කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

ක්වාසිවරයා හට මසකට රුපියල් 7,500/- ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 6,250/- ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කොට 2026 ජූලි මස 17 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය. අයදුම්පත සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

**ආනන්දි කනගරත්නම්,**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2026 ජූනි මස 26 දින,
කොළඹ 12,
තැ. පෙ. 573,
අලුත්කඩේ, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | *ක්වාසි අධිකරණය* | *ක්වාසි අධිකරණ කලාපය* |
|---|---|---|
| 01 | බේරුවල | කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 02 | බෝරා ප්‍රජාව | ශ්‍රී ලංකා බෝරා ප්‍රජාව |
| 03 | මොණරාගල | මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල අධිකරණ කලාපය |
| 04 | මීගමුව | ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව අධිකරණ කලාපය |
| 05 | යාපනය | යාපනය දිස්ත්‍රික්කයේ යාපනය, පේදුරුතුඩුව හා කයිට්ස් අධිකරණ කලාපය |

*අධිකරණ සේවා කොමිෂන් සභාව*

**1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය) යටතේ ක්වාසිවරයෙකු පත්කිරීමේ ඉල්ලුම්පත්‍රය**

ක්වාසි බල ප්‍රදේශය :-

1. මුලකුරු සමග නම :

උ: අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම :

උ: මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය : ව ව ව ව මා මා දි දි

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා. හැ. ප. අංකය :

10. දුරකතන අංකය :

11. <u>අධ්‍යාපන සුදුසුකම්</u>

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................
5. ..........................................................................................................................................

12. <u>වෘත්තීය සුදුසුකම්</u>

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................
5. ..........................................................................................................................................

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. ඉස්ලාම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද? : ඔව් නැත

15. විවාහක ද? : ඔව් නැත

16. භාර්යාව ජීවත්ව සිටී ද? : ඔව් නැත

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමග) :

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඉල්ලුම්කරු සතු දේපළවල වටිනාකම : රු.

19. මාසික ආදායම : රු.

20. කොපමණ ණය ගැති ද, ඇතොත් : රු.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද? ඔව් නැත

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද? ඔව් නැත

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුනේ ද? තිබේ ද? ඔව් නැත

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිවයුතු පුද්ගලයන් විය යුතු ය.)

| | |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| දුරකථන අංක : | දුරකථන අංක : |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

.........................................................., ..................................,

ඉල්ලුම්කරුගේ අත්සන. දිනය.

***සටහන :***
සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

06 - 348

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ඇබෑර්තු

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2026.07.15** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

*සැ.යු.:* **තනතුරු කිහිපයක් සඳහා අයදුම්කරන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.**

**1. වායු සමීකරණ හා ශීතකරණ කාර්මික තනතුර - [පුරප්පාඩු සංඛ්‍යාව 01]**

**1.1 වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,240 – 9 x 540 / 10 x 590 / 3 x 680 – රු. 60,040/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 87,000 /- ක් පමණ වේ.)

(ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධනය සිදු කිරීමට නියමිතයි).

**1.2 වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

**1.3 අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි ඇතුළු විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම.

**1.4 වෘත්තීය සුදුසුකම් :**

වායුසමීකරණ හා ශීතකරණ කාර්මික ක්ෂේත්‍රයට අදාළව NVQ IV සහතිකයක් ලබා තිබීම.

**1.5 පළපුරුද්ද :**

පිළිගත් ආයතනයක වායුසමීකරණ හා ශීතකරණ කාර්මික ක්ෂේත්‍රයේ වසර තුනකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතු යි.

**1.6 බඳවාගැනීමේ ක්‍රමය :**

වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**1.7 පරීක්ෂණ ක්‍රමවේදය :**

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන/තෝරාගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයක්/අධීක්ෂක මණ්ඩලයක් මගින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

අවශ්‍ය මූලික සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. ඒ සඳහා වෙන්කර ඇති මුළු ලකුණු සංඛ්‍යාව සියයකි (100):-

| *අනු. අංකය* | *නිර්ණායක* |
|---|---|
| 1 | අමතර අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | සේවා පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

**2 පුහුණු කම්කරු (සිවිල්) තනතුර - [පුරප්පාඩු සංඛ්‍යාව 05]**

**2.1 වැටුප් පරිමාණය:**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 42,290 - 9 x 490/10 x 540/6 x 590 - රු. 55,640/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම තනතුරට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 81,000/- ක් පමණ වේ).

[ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධන සිදු කිරීමට නියමිතය].

**2.2 වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

**2.3 අධ්‍යාපන සුදුසුකම් :**

සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(*සටහන* - ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව NVQ III සහතිකයක් ලබා තිබේ නම්, ඉහත පරිදි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම අනිවාර්ය නොවේ.)

**2.4 වෘත්තීය සුදුසුකම්:**

වෘත්තීය පුහුණු අධිකාරිය / ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හෝ රජයේ පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරන ලද වඩු කාර්මික, පෙදරේරු, ජලනලකරු, වැද්දුම්කරු හෝ පින්තාරුකරු යන ක්ෂේත්‍රයකට අදාළව NVQ III සහතිකයක් ලබා තිබීම.

**2.5 පළපුරුද්ද:**

රාජ්‍ය සේවයේ / පිළිගත් ආයතනයක ඉහත 4 හි දක්වා ඇති ක්ෂේත්‍රවලට අදාළව වසර 03කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**2.6 බඳවාගැනීමේ ක්‍රමය:**

වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මගිනි.

**2.7 පරීක්ෂණ ක්‍රමවේදය:**

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත්කරනු ලබන අධීක්ෂක මණ්ඩලයක් මගින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මගින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

(*අ*) වෘත්තීය පරීක්ෂණය :

මෙහිදී අයදුම්කරු සතු ශිල්පීය දැනුම, ප්‍රවීණතාවය සහ අවශ්‍ය කුසලතා පරීක්ෂා කරනු ලැබේ. ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

(*ආ*) සම්මුඛ පරීක්ෂණය :

සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| *අනු. අංකය* | *නිර්ණායක* |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂයය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන කුසලතා |

3. සේවා නියමයන් හා කොන්දේසි :

(i) මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබයි. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ සේවයේ ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක (01) වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ඇත.

(ii) තෝරා පත්කරගනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන්, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් දායකත්වය ලබා දිය යුතු ය.

(v) තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්‍ෂණයකට භාජනය විය යුතුය.

(vi) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත්කිරීමට පෙර ඔහු/ඇය පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම සිදු කරනු ඇත.

4. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් සිය අයදුම්පත්වලට (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

   i. උප්පැන්න සහතිකය;
   ii. ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්;
   iii. අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
   iv. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
   v. පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

5. රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතු ය.

6. තනතුර ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

7. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ සාවද්‍ය යැයි යමෙකු තෝරා ගැනීමට පෙර අනාවරණය කර ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

8. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙළ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**හංස අබේරත්න,**
(*වැ.බ.*) පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2026 ජූනි මස 19 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

*ආදර්ශ අයදුම්පත්‍රය*

**ඇබෑර්තු - 2026**

**------------------------------------------------------------------ තනතුර**

1. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ....................................................................

   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) : ....................................................................

   (ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (මහතා/මහත්මිය/මෙනවිය) ..........................................

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3. (අ) (i) පෞද්ගලික ලිපිනය : ........................................................................................................
........................................................................................................................................
........................................................................................................................................

   (ii) විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail) : ..................................................................

   (iii) දුරකථන අංකය : | | | | | | | | | | |

   (iv) WhatsApp දුරකථන අංකය : | | | | | | | | | | |

(ආ) (i) කාර්යාලයීය ලිපිනය : ..........................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

(ii) දුරකථන අංකය : | | | | | | | | | | |

(ඇ) විභාග ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ලිපිනය සඳහන් කරන්න.

පෞද්ගලික : ☐ රාජකාරි : ☐

4. (අ) උපන් දිනය : වර්ෂය : .............. මාසය : .............. දිනය : ..............
*(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතු ය.)*

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු : .............. මාස : .............. දින : ..............

5. විවාහක/අවිවාහක බව : ..........................................................................

6. ස්ත්‍රී /පුරුෂ භාවය : ..........................................................................

7. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/ නැත)

8. අධ්‍යාපන සුදුසුකම් *(සහතික පිටපත් අමුණා තිබිය යුතු ය.)*

| *විභාගය* | *විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|
| අ.පො.ස. (උ./ පෙළ) | | | |
| | | | |
| | | | |
| | | | |
| අ.පො.ස. (සා./ පෙළ) | සිංහල / දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් ***(සහතික පිටපත් අමුණා තිබිය යුතු ය.)***

| *පාඨමාලාව* | *ආයතනය* | *ක්‍රියාත්මක වන දිනය (Effective date)* |
|---|---|---|
| | | |
| | | |
| | | |

10. වෙනත් සුදුසුකම් *(සහතික පිටපත් අමුණා තිබිය යුතු ය.)*
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

11. පළපුරුද්ද *(සහතික පිටපත් අමුණා තිබිය යුතු ය.)*

| *ආයතනය* | *තනතුර* | *සේවා කාලසීමාව* |
|---|---|---|
| | | |
| | | |
| | | |

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර ***(අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු ය.)***

(අ) ආයතනයේ නම : ..........................................................................................
(ආ) ආයතනයේ ලිපිනය : ..........................................................................................
(ඇ) මුල් පත්වීමේ දිනය : ..........................................................................................
(ඈ) දැනට දරන තනතුර : ..........................................................................................
(ඉ) මාසික මූලික වැටුප : ..........................................................................................
(ඊ) දීමනා : ..........................................................................................
(උ) දළ වැටුප : ..........................................................................................

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත්ද? (ඔව්/ නැත)
එසේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න. : ..........................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේද? (ඔව්/ නැත)
එසේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න. : ..........................................................................................
..........................................................................................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන්කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතුවන බව දනිමි.

දිනය : .................................. ..............................................................,
අයදුම්කරුගේ අත්සන.

**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

**රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ........................................ තනතුර දරන ........................................................ මයා/මිය/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

දිනය : ............................... ..................................................................,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

06 - 384

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

(2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ව්‍යවස්ථාපිත)

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.

01. **ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි (තනතුරු 01) :**
**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. සමාජයීය විද්‍යාව, ජනමාධ්‍ය හෝ නීතිය පිළිබඳ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී උපාධියක්;

*සමග*

අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණයන්ට අදාළ වූ පශ්චාත් උපාධියක් (**Masters**) ලබා තිබීම;

*සහ*

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (**08**) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

2. සමාජයීය විද්‍යාව, ජනමාධ්‍ය හෝ නීතිය පිළිබඳ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් (**PhD);**

*සහ*

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහ (**05**) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්** (පහත සඳහන් **1** හෝ **2** හෝ **3)**

**1.** ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**2.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ විශේෂවේදී / සාමාන්‍ය උපාධියක් ;

*සමග*

නීතිය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් (**Masters**) ලබා තිබීම;

*සහ*

"අධ්‍යයන/පර්යේෂණ" සේවා ගණයෙහි (**AR 1**) තනතුරක අවම වශයෙන් වසර අට (**08**) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**3.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ විශේෂවේදී / සාමාන්‍ය උපාධියක්;

*සමග*

අදාළ ක්ෂේත්‍රයකින් නීතිය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා ක්ෂේත්‍රය ආචාර්ය උපාධියක් (**PhD**) ලබා තිබීම;

*සහ*

"අධ්‍යයන/පර්යේෂණ" සේවා (**AR 1**) ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (**05**) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

***වයස :*** අවුරුදු 30 ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

***වැටුප් ක්‍රමය*** **- AR 2 - 2025** රු. **(133,220 - 10 x 3,600 – රු. 169,220)**

02. **නීති නිලධාරි (තනතුරු 01) :**

***සුදුසුකම් :*** **බාහිර අයදුම්කරුවන්**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීම සහ දිවුරුම් දීමෙන් පසුව වසර තුනකට (03) නොඅඩු කාලයක් නීති ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

*වයස* : අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

*වැටුප් ක්‍රමය* **- MM 1-1 - 2025 - රු. (91,690 - 10 x 2,480 - 15 x 3,450 - රු. 168,240)**

03. **පර්යේෂණ නිලධාරි- (තනතුරු 01) :**

**සුදුසුකම් :** ***බාහිර අයදුම්කරුවන්***

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජයීය විද්‍යාව, නීතිය හා ජනමාධ්‍ය පිළිබඳ විශේෂවේදී උපාධියක් ලබා තිබීම;

*හෝ*

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජීය විද්‍යාව, නීතිය හා ජනමාධ්‍ය පිළිබඳ සාමාන්‍ය උපාධියක් සමග පර්යේෂණාත්මක අධ්‍යයනයකින් යුතු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

***අභ්‍යන්තර අයදුම්කරුවන්* :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

*වයස* : අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

*වැටුප් ක්‍රමය* **- AR 1 - 2025 - රු. (91,650 - 10 x 2,480 - 15 x 3,450 - රු. 168,200)**

04. **මුල්‍ය නිලධාරි- (තනතුරු 01) :**
**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3)**

**01.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය හෝ වාණිජ විද්‍යා උපාධියක් ලබා තිබීම.

**02.** තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වෘත්තීය ආයතනයක **(SLICA, ACCA,CIMA,CMA)** අන්තර් මාධ්‍ය පරීක්ෂණය සමත්වීම.

**03.** ගණකාධිකරණය හෝ වාණිජ විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම **(HNDA)** සහ සුදුසුකම ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
02. "කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන" **(MA1)** සේවා ගණයෙහි **II** වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

*වයස* : අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් ක්‍රමය **- JM 1-1 – 2025 - රු. (72,650 - 10 x 1,360 - 18 x 2,040 - රු. 122,970)**

05. **සංවර්ධන නිලධාරි- (තනතුරු 04) :**

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම.

*වයස* : අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

*වැටුප් ක්‍රමය* **- MA 3 - 2025 - රු. (53,940 - 10 x 800 - 11 x 1,190 - 10 x 1,320 - 5 x 1,350 - රු. 94,980)**

06. **භාෂා පරිවර්තක (දෙමළ) - (තනතුරු 01) :**

**සුදුසුකම් - බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව හෝ විෂයක් ලෙස සමත්ව ලබා ගත් උපාධියක් තිබීම;

*සහ*

උපාධිය සඳහා දෙමළ භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව හා සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

වයස : අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

*වැටුප් ක්‍රමය* - **MA3 - 2025 - රු. (53,940 - 10 x 800 - 11 x 1,190 - 10 x 1,320 - 5 x 1,350 - රු. 94,980)**

07. **කළමනාකරණ සහකාර - (තනතුරු 01)**

**සුදුසුකම් - බාහිර අයදුම්කරුවන්**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී :-

**(i)** සිංහල / දෙමළ
**(ii)** ගණිතය
**(iii)** ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) *තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්*: - පරිගණක හැකියාව පිළිබඳ මාස 06 කට නොඅඩු පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද සහතිකය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

(අ) *ප්‍රාථමික ශ්‍රේණිය*.- ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකි ය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී :-

**(i)** සිංහල / දෙමළ
**(ii)** ගණිතය
**(iii)** ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතු ය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

*සටහන්* :- **(I)** යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාලපරිච්ඡේදයක් ඉහත "ඉ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාලපරිච්ඡේද ඉහත " ඉ " ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

*වයස* **:** අවුරුදු 18 නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය.

*වැටුප් ක්‍රමය* **- MA 1-2 - 2025 - රු. (46,220 - 10 x 540- 7 x 630 - 12 x 1,080 - 12 x 1,280 - රු. 84,350)**

08. **ලේඛන සහකාර - (තනතුරු 01) :**

**සුදුසුකම් - බාහිර අයදුම්කරුවන් :**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී :-

**(i)** සිංහල / දෙමළ
**(ii)** ගණිතය
**(iii)** ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) *තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්* :- පරිගණක හැකියාව පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන මාස 06 කට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

(අ) *ප්‍රාථමික ශ්‍රේණිය* - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකි ය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී :-

**(i)** සිංහල / දෙමළ
**(ii)** ගණිතය
**(iii)** ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ඇ) *තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්* : - පරිගණක හැකියාව පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන මාස 06 කට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

(ඈ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතු ය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

*සටහන් :-* **(I)** යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත “ඉ” ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාලපරිච්ඡේද ඉහත “ ඉ “ ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

*වයස* **:** අවුරුදු 18 නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය.

*වැටුප් ක්‍රමය* **- MA 1-2 - 2025 -** රු. **(46,220 - 10 x 540- 7 x 630 - 12 x 1,080 - 12 x 1,280 -** රු. **84,350)**

අයදුම්කරුවන් සහතිකවල ඡායා පිටපත් සමඟ තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් **2026 ජූලි 13 දින ප.ව. 4.00** ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුයි. කවරයේ වම් කෙළවරෙහි **අයදුම් කරන ලද තනතුර** සඳහන් කළ යුතු ය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ
කොමිෂන් සභාව.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,
කාමර අංක 203,
ගොඩනැගිලි අංක 02,
බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

06- 323

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2024(2026)**

අංක 1930/12 හා 2015.09.01 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා පවත්වනු ලබන විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් **2026 ඔක්තෝබර් මස** කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම් වෙත බලය ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exam/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ජූනි මස 29 වැනි දින පෙ.ව. 9.00ට** විවෘත වන අතර, **2026 ජූලි මස 24 වැනි දින ප.ව. 9.00ට අවසන් වේ.**

නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**02.** 2024.12.31 දිනට -

(i.) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (5) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නියමිත වැටුප් වර්ධක පහම (5) උපයාගෙන ඇති;

(ii.) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති;

(iii.) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති, නිලධරයන් මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

**03.** වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025හි විධිවිධාන අනුව සිදු කෙරේ.

එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය :-

(MN-7-2025 4 පියවර ) රු: 75,320- 8 x 1,360 - 18x1,850 - රු: 119,500 වන අතර, එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් ඉහත චක්‍රලේඛයේ උපලේඛන III අනුව වැටුප් ගෙවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

**04.** ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ක්‍රමය පහත පරිදි වේ :-

(i.) **බඳවා ගන්නා ප්‍රතිශතයන්:**

| | |
|---|---|
| සීමිත | 40%; |
| සේවා පළපුරුද්ද හා කුසලතා | 60%; |

(ii.) අනුමත තනතුරු සංඛ්‍යාව 04 ක් වන විට සීමිත තරග විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පළපුරුද්ද හා කුසලතාව යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 75% විය යුතු අතර, අනුමත තනතුරු සංඛ්‍යාව 03 ක් වන විට ඉහත සීමිත තරග විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 33.33 % හා සේවා පළපුරුද්ද හා කුසලතාව යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 66.66 % විය යුතු ය;

(iii.) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව 04කට වැඩි නම්, ඉහත ඡේද අංක 04. (i) හි සඳහන් ප්‍රතිශතයන්ට යටත්ව සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත පුරප්පාඩු පිරවීම සිදු කළ යුතු ය;

(iv.) රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත් වන්නන් අදාළ සෙසු අවශ්‍යතා ද සම්පූර්ණ කර ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතා අනුපිළිවෙළ මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විභාග පැවැත්වූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි;

(v) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල අදාළ කරගත යුතු වන්නේ 2024 වර්ෂයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි;

(vi) මෙම විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා එක් එක් දෙපාර්තමේන්තුවල හා අමාත්‍යාංශවල ඒ ඒ තනතුරේ පවතින පුරප්පාඩු පුරවනු ලැබේ.

**05. අනන්‍යතාව සනාථ කිරීම :**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ :-

(අ) ජාතික හැඳුනුම්පත;
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කරගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**06. අයදුම්පත් :**

(i) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත් වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගැනීම අවසන් වන පැයට මාර්ගගත පද්ධතියේ සඳහන් තොරතුරු නිවැරදි සේ සලකා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

(ii) අයදුම්කරුවන්ට තම අයදුම්පතේ සඳහන් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය සඳහා අයදුම්කරුවන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම ඉදිරිපත් වුවහොත් එම මාධ්‍ය තුනෙන්ම විභාගය පවත්වනු ලබන අතර, අයදුම්කරුවන් විසින් තමා පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතු වේ.

(iii) අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැක.

(iv) විභාග ගාස්තුව රු.600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය :-

- ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
- අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ් පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);
- ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම (Online Banking Method/ Flex App of Bank of Ceylon);
- ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of Bank of Ceylon).

*සටහන :-*

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම

ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

**07.** (i) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත.

(ii) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින්/අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(iii) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර, විභාග දිනයේ දී තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(iv) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

**08.** ඉහත (07) වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියවිලි සලකා බලනු නොලැබේ.

**09. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම**

මෙම විභාගයේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ ප්‍රතිඵල අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව අයත් වන සේවය සංශෝධනය කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

**10. විභාග පරිපාටිය**

(i) I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

(1) අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය පැය 1 කි. - ලකුණු 100 යි
(2) කළමනාකරණය - කාලය පැය 3 කි. - ලකුණු 100 යි

සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු වේ.

පළමු වන ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ.

**අභියෝග්‍යතා පරීක්ෂණය - විෂය අංකය ( 1 )**

තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්යසාධන මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කර ගෙන තිබේ ද යන්න හා ඒවා භාවිතයේ දී ඉහළ ප්‍රවීණතාවක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

දෙවැනි ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ:-

**කළමනාකරණය - විෂය අංකය ( 2 )**

(i) කළමනාකරණ මූලධර්ම
(ii) කළමනාකරණ ශ්‍රිත
සැලසුම් කිරීම
තීරණ ගැනීම
තීරණ ගැනීමේ ක්‍රියාවලිය
සංවිධානය
මාණ්ඩලීකරණය
මෙහෙයවීම
අභිප්‍රේරණ ක්‍රියාවලිය
නායකත්වය
පාලනය
පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලි
(iii) සහභාගිත්ව කළමනාකරණය
(iv) කළමනාකරණ පරිසරය
(v) සිද්ධි අධ්‍යයනය
මෙය ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

**11.** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. **විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.**

**12.** මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

**13.** මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර,**
**ලේකම්,**
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2026 ජුනි මස 15 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

06 - 307

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2026

2025 වර්ෂයට නියමිත දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර, විභාගය 2026 සැප්තැම්බර් මස පැවැත්වීමට කටයුතු යොදා ඇත.

02. *විභාග මධ්‍යස්ථාන* :- **උපලේඛනය 01 හි** දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයකම අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී නගරයේ විභාග මධ්‍යස්ථානය අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත.

03. *භාෂා මාධ්‍ය* :- මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. එහෙත් යම් අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි. අයදුම්පතේ සඳහන් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. *සුදුසුකම්*:- මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවකුම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් බුද්ධ ධර්මය විෂයය ඇතුළුව විෂයයන් 06කින් සමත්ව සිටීම;

*හෝ*

4.2 බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් පවත්වන දහම් පාසල් ශ්‍රේණි විභාගයෙන් 10 ශ්‍රේණිය විභාගය සමත් වී සිටීම.

05. අයදුම් කිරීම :-

5.1. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2025.11.06 වන දිනට ලියාපදිංචි දහම් පාසල්වලට අවශ්‍ය අයදුම්පත් හා උපදෙස් පත්‍රිකා තැපැල් මඟින් මේ වන විට යොමු කර ඇති අතර www.donets.lk වෙබ් අඩවිය මඟින් ද බාගත කර ගැනීමේ පහසුකම සලසා ඇත.

5.2 කවර හෝ පුද්ගලයකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේ වුවත් 04 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මඟින්

රු.200/-ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබා දෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර දෙවන පිටපත ප්‍රධානාචාර්යවරයා වෙත තබා ගත යුතු ය. අයදුම්පත් දෙකෙහිම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතු ය.

මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

5.4 අයදුම්පත් භාර ගැනීමේ දිනය **2026.06.26** දිනෙන් ආරම්භවී **2026.07.24** දිනෙන් අවසන් වේ.

5.5 අයදුම්පත්වල අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් කිරීමේදී ජාතික හැඳුනුම්පතේ සඳහන් ආකාරයටම විය යුතු අතර ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කිරීම අනිවාර්ය වේ. ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතු ය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 විභාගයට ඉදිරිපත් කරන සියලුම අයදුම්කරුවන් විසින් අයදුම්පතේ සඳහන් සම්පූර්ණ කර ඇති තොරතුරු පෞද්ගලිකව පරීක්ෂා කර බලා අත්සන් කළ යුතු අතර සියලු අයදුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් විභාග ප්‍රතිඵල නිකුත් කරන තෙක් දහම් පාසල් ප්‍රධානාචාර්යවරයා ළඟ තබා ගත යුතු වේ.

5.7 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන ප්‍රධානාචාර්යවරයා වගකිව යුතු ය.

5.8 දහම් පාසලේ ලියාපදිංචි අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. දහම් පාසලේ ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු අතර දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල** ලිපිනයට ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. අයදුම්පත බහා එවන කවරයේ වමත් පස කෙළවරේ **"දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2026"** යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතු ය.

5.9 තැපෑලේ දී යම් අයදුම්පත්‍රයක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලබන අතර අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් පිළිබඳ වගකීම දහම් පාසල් ප්‍රධානීන් විසින් භාර ගත යුතු ය.

06. *විභාග ගාස්තු.-* මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු.200කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා විභාග ගාස්තුව රු.50 කි.

6.1 විභාග ගාස්තු ගෙවීම.- අදාළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා විසින් ගාස්තු ගෙවිය යුතු සියලුම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක **20-03-02-13**ට බැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට එම සම්පූර්ණ මුදල ගෙවා ලදුපතක් ලබාගෙන එම ලදුපත අයදුම්පතේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6.2 කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීම හෝ ආපසු ගෙවීම හෝ සිදු කරනු නොලැබේ.

07. ප්‍රවේශ පත්‍ර.- විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙතම විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍රයක්, අයදුම්පත් ඉදිරිපත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා වෙත නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින්ම ස්වකීය විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේ දී ම විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය. යම් අයදුම්කරුවකු තම විභාග ප්‍රවේශ පත්‍රය භාර නොදී

සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 විභාග ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසල අයත් විහාරස්ථානයේ විහාරාධිපති හිමි හෝ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා හෝ ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතු ය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර විභාග ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතු ය. එවැනි සෑම අවස්ථාවකම පහත සඳහන් විස්තර සැපයිය යුතු ය.

1. විභාගයේ නම;
2. දහම් පාසලේ නම හා දුරකථන අංකය ;
3. දහම් පාසලට ලබාදී ඇති පරිගණක අංකය ;
4. අයදුම්කරුගේ සම්පූර්ණ නම ;
5. අයදුම් කළ විභාග මධ්‍යස්ථානය/ නගරය ;
6. අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය;
7. අයදුම්පත ලියාපදිංචි කළ කුවිතාන්සිය;
8. විභාග ගාස්තු ගෙවූ ලදුපත් පිටපත.

08. අනන්‍යතාව.- විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත,
- වලංගු විදේශ ගමන් බලපත්‍රය,
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

09. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම:- මෙම විභාගය සඳහා නියමිත විෂය ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයයන් හතරෙන්ම සමත් විය යුතු ය. කෙසේ වෙතත් එක් වතාවකදී අදාළ විෂයය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී ඉදිරි වර්ෂ දෙක (02) ඇතුළත දී එම ඌන සාමර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමර්ථය සම්පූර්ණ කළ යුතු ය. ඌන සාමර්ථය ලබන සිසුන් ඌන සාමර්ථය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන්ම ඌන සාමර්ථය ලැබූ විෂයයට පමණි.

10.1 සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර, සමත් වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ.

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

10.2 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10.3 විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

11. *සහතික පත්‍ර.-* මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් වෙත තැපැල් මගින් ලබා දෙනු ඇත. විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණ යම් අපේක්ෂකයකු වේ නම්, ඒ පිළිබඳව දහම් පාසල් ප්‍රධානාචාර්ය මගින් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙන් ලිඛිතව විමසීම් කළ යුතු ය.

12. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය.-* දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30 ක් ඇතුළත

නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

13. විෂයය නිර්දේශය.- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කොට පැවැත්වීමට නියමිත දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගයට අදාළ විෂයය නිර්දේශය උපලේඛන 02 ලෙස මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත.

14. මෙම නිවේදනයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

**ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,**
විභාග කොමසාරිස් ජනරාල්.

2026 ජුනි මස 26 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

**01 උපලේඛනය**

**ඒ ඒ දිස්ත්‍රික්කයන් හි විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක**

| *දිස්ත්‍රික්කය හා අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| **කොළඹ 01** | කොටහේන | 101 |
| | මරදාන | 102 |
| | බොරැල්ල | 103 |
| | බම්බලපිටිය | 104 |
| | මහරගම | 105 |
| | ගල්කිස්ස | 106 |
| | දෙහිවල | 107 |
| | නුගේගොඩ | 108 |
| | මොරටුව | 109 |
| | පිළියන්දල | 110 |
| | හෝමාගම | 111 |
| | අවිස්සාවේල්ල | 112 |
| | | |

| *දිස්ත්‍රික්කය හා අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| **ගම්පහ 02** | ගම්පහ | 201 |
| | වේයන්ගොඩ | 202 |
| | මිනුවන්ගොඩ | 203 |
| | මිරිගම | 204 |
| | මීගමුව | 205 |
| | වත්තල | 206 |
| | කැලණිය | 207 |
| | | |
| **කළුතර 03** | කළුතර | 301 |
| | පානදුර | 302 |
| | අලුත්ගම | 303 |
| | හොරණ | 304 |
| | මතුගම | 305 |
| | මීගහතැන්න | 306 |
| | | |
| **මහනුවර 04** | මහනුවර | 401 |
| | කටුගස්තොට | 402 |
| | නුගවෙල | 403 |
| | තෙල්දෙණිය | 404 |
| | මැද මහනුවර | 405 |
| | වත්තේගම | 406 |
| | ගලහා | 407 |
| | ගලගෙදර | 408 |
| | ගම්පොළ | 409 |
| | නාවලපිටිය | 410 |
| | පිළිමතලාව | 411 |
| | | |
| **මාතලේ 05** | මාතලේ | 501 |
| | ගලේවෙල | 502 |
| | දඹුල්ල | 503 |
| | නාඋල | 504 |
| | ලග්ගල-පල්ලේගම | 505 |
| | | |
| **නුවරඑළිය 06** | නුවරඑළිය | 601 |
| | හැඳුනුවැව | 602 |
| | හැටන් | 603 |
| | ගිනිගත්හේන | 604 |
| | හඟුරන්කෙත | 605 |
| | වලපනේ | 606 |

| *දිස්ත්‍රික්කය හා අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| | | |
| ගාල්ල **07** | ගාල්ල | 701 |
| | අම්බලන්ගොඩ | 702 |
| | බලපිටිය | 703 |
| | ඇල්පිටිය | 704 |
| | බද්දේගම | 705 |
| | උඩුගම | 706 |
| | අහංගම | 707 |
| | | |
| මාතර **08** | මාතර | 801 |
| | වැලිගම | 802 |
| | කඹුරුපිටිය | 803 |
| | හක්මන | 804 |
| | දික්වැල්ල | 805 |
| | අකුරැස්ස | 806 |
| | දෙනියාය | 807 |
| | කොටපොල | 808 |
| | | |
| හම්බන්තොට **09** | හම්බන්තොට | 901 |
| | වලස්මුල්ල | 902 |
| | වීරකැටිය | 903 |
| | තංගල්ල | 904 |
| | අම්බලන්තොට | 905 |
| | බෙලිඅත්ත | 906 |
| | තිස්සමහාරාමය | 907 |
| | අඟුණුකොළපැලැස්ස | 908 |
| | | |
| වවුනියාව **12** | වවුනියාව | 1201 |
| | | |
| අම්පාර **16** | අම්පාර | 1601 |
| | සේරංකඩ | 1602 |
| | මහඔය | 1603 |
| | දෙහිඅත්තකණ්ඩිය | 1604 |
| | | |
| ත්‍රිකුණාමලය **17** | ත්‍රිකුණාමලය | 1701 |
| | කන්තලේ | 1702 |
| | | |
| කුරුණෑගල **18** | කුරුණෑගල | 1801 |
| | පොල්ගහවෙල | 1802 |
| | ඉබ්බාගමුව | 1803 |

| *දිස්ත්‍රික්කය හා අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| | මැල්සිරිපුර | 1804 |
| | කුලියාපිටිය | 1805 |
| | හෙට්ටිපොල | 1806 |
| | නිකවැරටිය | 1807 |
| | මහව | 1808 |
| | ගල්ගමුව | 1809 |
| | | |
| පුත්තලම **19** | පුත්තලම | 1901 |
| | ආණමඩුව | 1902 |
| | හලාවත | 1903 |
| | වෙන්නප්පුව | 1904 |
| | | |
| අනුරාධපුරය **20** | අනුරාධපුරය | 2001 |
| | මැදවච්චිය | 2002 |
| | කැකිරාව | 2003 |
| | පදවිය | 2004 |
| | ගලෙන්බිඳුණුවැව | 2005 |
| | තඹුත්තේගම | 2006 |
| | හොරොව්පොතාන | 2007 |
| | නොච්චියාගම | 2008 |
| | | |
| පොළොන්නරුව **21** | පොළොන්නරුව | 2101 |
| | මනම්පිටිය | 2102 |
| | හිඟුරක්ගොඩ | 2103 |
| | මැදිරිගිරිය | 2104 |
| | | |
| බදුල්ල **22** | බදුල්ල | 2201 |
| | වැලිමඩ | 2202 |
| | බණ්ඩාරවෙල | 2203 |
| | පස්සර | 2204 |
| | මහියංගනය | 2205 |
| | ගිරාඳුරුකෝට්ටේ | 2206 |
| | මීගහකිවුල | 2207 |
| | | |
| මොනරාගල **23** | මොනරාගල | 2301 |
| | බිබිල | 2302 |
| | වැල්ලවාය | 2303 |
| | කතරගම | 2304 |
| | දොඹගහවෙල | 2305 |
| | | |

| *දිස්ත්‍රික්කය හා අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| **රත්නපුර 24** | රත්නපුර | 2401 |
| | ඇහැලියගොඩ | 2402 |
| | පැල්මඩුල්ල | 2403 |
| | බලංගොඩ | 2404 |
| | ඇඹිලිපිටිය | 2405 |
| | රක්වාන | 2406 |
| | කලවාන | 2407 |
| | | |
| **කෑගල්ල 25** | කෑගල්ල | 2501 |
| | අරණායක | 2502 |
| | රඹුක්කන | 2503 |
| | මාවනැල්ල | 2504 |
| | රුවන්වැල්ල | 2505 |
| | යටියන්තොට | 2506 |
| | වරකාපොළ | 2507 |

**02 උපලේඛනය**

**විභාග විෂය නිර්දේශය**

(1993 සිට ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා)

මෙම විභාගය පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 04කින් සමන්විතය.

**පළමු ප්‍රශ්න පත්‍රය - බුද්ධ චරිතය**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තයි.

**I වැනි කොටස**

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි පැවති භාරතීය සමාජය අවබෝධ කර ගැනීම :-

(අ) සාමාජීය පසුබිම
(ආ) දේශපාලනික පසුබිම
(ඇ) ආර්ථික පසුබිම
(ඈ) ආගමික හා දාර්ශනික පසුබිම

**II වැනි කොටස**

බුද්ධ චරිතය :-

(අ) සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට සම්බුද්ධ පරිනිර්වාණය තෙක් බුද්ධ චරිතය
(ආ) බුද්ධ චරිතයේ කැපී පෙනෙන විශිෂ්ට ලක්ෂණ - තාදී ගුණය, අසරණයන්ට පිහිටවීම, ගිලනුන්ට උපස්ථාන කිරීම, හික්මවිය යුතු පුද්ගලයින් හික්මවීම, ඉවසීම, අන්‍ය මත ඉවසීම
(ඇ) බුදුරජාණන් වහන්සේගේ ලොව්තුරු ගුණ
(ඈ) බුදුරජාණන් වහන්සේගේ සමාජ ශෝධකත්වය
(ඉ) බුදුරජාණන් වහන්සේගේ නායකත්වය

**III වැනි කොටස**

බුදුරජාණන් වහන්සේගේ සිව්වණක් පිරිස :-

(අ) භික්ෂු - පස්වග භික්ෂූන්, සැරියුත් මුගලන්, මහා කාශ්‍යප, ආනන්ද, සීවලී, මහා කච්චාන, පුණ්ණමන්තානි පුත්ත, කුමාර කාශ්‍යප යන රහතන් වහන්සේ පිළිබඳ දැනුම
(ආ) භික්ෂුණී - මහාප්‍රජාපතී ගෝතමී, ඛේමා, උප්පලවණ්ණා, භද්දකච්චායනා, ධම්මදින්නා, අම්බපාලි, පටාචාරා යන තෙරණින් වහන්සේ පිළිබඳ දැනුම
(ඇ) උපාසක - සේනිය, බිම්බිසාර, පසේනදී කෝසල, අජාසත්, අනාථ පිණ්ඩික, ධම්මික යන උපාසකවරුන් පිළිබඳ දැනුම
(ඈ) උපාසිකා - විශාඛා, කෝසල මල්ලිකා, සෝමාවතී, ඛුජ්ජුත්තරා යන උපාසිකාවන් පිළිබඳ දැනුම

**දෙවන ප්‍රශ්න පත්‍රය - බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.

**I වැනි කොටස**

බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම :-

(අ) පටිච්ච සමුප්පාදය
(ආ) චතුරාර්ය සත්‍යය
(ඇ) ත්‍රිලක්ෂණය
(ඈ) කර්මය සහ පුනර්භවය
(ඉ) නිර්වාණය

මෙම ධර්ම කරුණු පිළිබඳ ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායයෙහි අර්ථ විවරණය පිළිබඳ සාමාන්‍ය අවබෝධය

**II වැනි කොටස**

භාවනා සහ අභිධර්මය :-

(අ) සමථ, විපස්සනා භාවනා
(ආ) අභිධර්මයෙහි සතර පරමාර්ථ ධර්ම පිළිබඳ සාමාන්‍ය දැනුම

**III වැනි කොටස**

පාලි භාෂා පරිචය :-

පහත සඳහන් ගාථා සහ පාඨ සිංහලට පරිවර්තනය කිරීම.

(අ) ධම්මපදය - යමක වග්ග 19, 20, ගාථාථ පුප්ප වග්ග 03 වන ගාථාව, බාල වග්ග - 05, 06, 10, 14, 15 ගාථා, පණ්ඩිත වග්ග 12, 13, 14 ගාථා

(ආ) චතු භාණවාර පාලි :-
   i. මිත්තානිසංස සුත්ත
   ii. මෙත්තානිසංස සුත්ත
   iii. ඛන්ධ පරිත්ත

(ඇ) රසවාහිණී - දුට්ඨ ගාමිණී අභය මහාරඤ්ඤෙවත්ථු

(ඈ) වන්දනා ගාථා සහ පාඨ
   i. තෙරුවන් ගුණ පාඨ සහ වන්දනා ගාථා
   ii. ආමිස පූජා ගාථා

**<u>තෙවන ප්‍රශ්න පත්‍රය - ශාසන ඉතිහාසය</u>**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තයි.

   i. භාරතීය ශාසන ඉතිහාසය
   ii. ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය

**I වැනි කොටස**
භාරතීය ශාසන ඉතිහාසය :-

(අ) බෞද්ධ ධර්මදූත සේවාවේ ආරම්භය සහ බුද්ධ කාලීන ශාසන ව්‍යාප්තිය
(ආ) ධර්ම සංගායනා සතර
(ඇ) අශෝක සමය
(ඈ) අශෝක රජතුමා බෞද්ධයකු වීම
(ඉ) අශෝක ධර්මය
(ඊ) අශෝක රජුගේ ලෝක ශාසනික සේවාව
(උ) බෞද්ධ ඉතිහාසයේ අශෝක රජතුමාට හිමි තැන අගය කිරීම

**II වැනි කොටස**
ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය :-

(අ) මහින්දාගමනය සහ බුද්ධ ශාසන ප්‍රතිෂ්ඨාපනය
(ආ) භික්ෂුණී සමාජය
(ඇ) ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවීම
(ඈ) දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවීම
(ඉ) මහා විහාරය
(ඊ) අභයගිරි විහාරය
(උ) ජේතවන විහාරය
(ඌ) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
(එ) බුදු සමයෙන් ලක්වැසියන් ද ලද ආභාෂය

**<u>සිව්වන ප්‍රශ්න පත්‍රය - බෞද්ධ සංස්කෘතිය</u>**

මෙම ප්‍රශ්න පත්‍රය බෞද්ධ සිරිත් විරිත්, ශ්‍රී ලංකාවේ කලා ශිල්ප හා ලෝක බෞද්ධ සංස්කෘතිය යන කොටස් තුනකින් යුක්ත වෙයි.

**I වැනි කොටස**
බෞද්ධ සිරිත් විරිත් :-

(අ) බෞද්ධ සිරිත් විරිත්වල වැදගත්කම
(ආ) බෞද්ධ ආරාම (පැවිදි) ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත්
(ඇ) ආරාම ජීවිතය පදනම් වූ බෞද්ධ ගිහි සිරිත් විරිත්
(ඈ) ගිහි පවුල් ජීවිතය සම්බන්ධ සිරිත් විරිත්
(ඉ) ශාසනික කටයුතු පිළිබඳ සිරිත් විරිත්

(සාංඝික දාන, කඨින දාන, ධර්ම දේශනා හා ධර්ම ශ්‍රවණ, පිරිත් පිංකම් හා බෝධි පූජා) බෞද්ධ උත්සව

**II වැනි කොටස**
ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප :-

- බුදු දහමෙන් සිදු වූ කලා පෝෂණය
- බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය (ස්ථූප, චෛතියඝර, බෝධිඝර, පධානඝර)
- බෞද්ධ මූර්ති, කැටයම් හා චිත්‍ර ශිල්පය

   i. බුදු පිළිමය - උපත හා ව්‍යාප්තිය, අනුරාධපුර සමාධි පිළිමය, තොලුවිල සමාධි පිළිමය, අවුකන බුදු පිළිමය, ගල් විහාර බුදු පිළිමය
   ii. කැටයම් - වාහල්කඩ, සඳගල පහණ, මුරගල්, කොරවක්ගල් හා පියගැට
   iii. බෞද්ධ චිත්‍ර කලාව - අනුරාධපුර, පොළොන්නරුව හා මහනුවර යුගයේ බිතුසිතුවම් (මහියංගන ධාතු ගර්භය, තිවංක පිළිමගේ, දෙගල්දොරුව, කැලණියේ අලුත් විහාරය, ගෝතමී විහාරය යන ස්ථානවල බිතු සිතුවම්)

**III වැනි කොටස**
සිංහල බෞද්ධ සාහිත්‍යය :-

- බෞද්ධ කථා සාහිත්‍යයේ ආචාර විද්‍යාත්මක වටිනාකම, ජාතක පොත, සද්ධර්මරත්නාවලිය හා පූජාවලිය පිළිබඳ සාමාන්‍ය දැනීම
- සිංහල භක්ති කාව්‍යය - බුදු ගුණ අලංකාරය හා තුන් සරණය පිළිබඳ සාමාන්‍ය දැනීම.

**IV වැනි කොටස**
ලෝක බෞද්ධ සංස්කෘතිය :-

පහත සඳහන් රටවලට බුදු දහම පැමිණීම, ව්‍යාප්තිය හා බෞද්ධ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ සාමාන්‍ය දැනුම

(අ) මියන්මාරය (බුරුමය)
(ආ) තායිලන්තය
(ඇ) චීනය
(ඈ) ජපානය

පරිශීලනය කළ යුතු ග්‍රන්ථ :-
- බෞද්ධ සංස්කෘතිය - සිරිසීවලී හිමි
- කලා ශිල්ප හා සාහිත්‍ය - ඩී.ආර්. ජයවර්ධන මයා

අතිරේක කියවීම් පොත් :-
- බුදු සිරිත - ආචාර්ය කේ.ඩී.පී. වික්‍රමසිංහ මයා

06 - 362

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වන සීමිත තරග විභාගය - 2025 (2026)**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ අනුමත තනතුරු පවතින අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු /පළාත් සභාවල ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 03 ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නිරතව සිටින නිලධාරින්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

- ❖ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications –Recruitment Exams/E.B.Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ජුනි මස 29 වැනි දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026 ජූලි මස 24 දින ප.ව.09:00 ට අවසන් වේ.**

- ❖ දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

- ❖ අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**01.** මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 ඔක්තෝබර් මස කොළඹ දී පවත්වනු ඇත. රට තුළ උද්ගතවිය හැකි විශේෂ තත්ත්වයක් මත පමණක් විභාගය දිවයින පුරා පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එසේවුවද වුවත් කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කර නොමැති අවස්ථාවකදී එම මධ්‍යස්ථානයට මනාපය පළ කර ඇති අයදුම්කරුවන් වෙනත් විභාග මධ්‍යස්ථානයකට යොමු කරනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.

මෙම නිවේදනයේ "පත්වීම් බලධරයා" යනුවෙන් අදහස් කරනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

**02. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවාගැනීම් සිදු කරනු ලැබේ.

**03. පුරප්පාඩු සංඛ්‍යාව : 03**

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

සීමිත ධාරාව යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවකදී එම ප්‍රමාණය ද විවෘත ධාරාව යටතේ බඳවා ගැනේ.

**04. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :**

4.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු නියමයන් හා කොන්දේසිවලට ද අංක 1877/28 දරන 2014.08.28 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථා විධිවිධානවලට ද අදාළ වන පරිදි දෙපාර්තමේන්තු නියෝගවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ මුදල් රෙගුලාසිවලට ද අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීතිවලට ද (මින් මතුවට කාර්යය පටිපාටික රීති ලෙස හඳුන්වනු ලබන), ඉහත නියමයන්, කොන්දේසි, නියෝග, විධිවිධාන, රෙගුලාසි හා රීතිවලට දැනටමත් කර ඇති හෝ මින් මතු කරනු ලැබිය හැකි සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් අදාළ තනතුරේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

4.2. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරු යටත් විය යුතු වේ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/

වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් කලින් කලට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.3. මෙම පත්වීම් වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ය. සේවයට බඳවා ගෙන වසර තුනක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

4.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

4.5. පත්වීම්ලාභියකු දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

4.6. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා/ හෝ පත් කරන ලද තනතුරක හෝ පත්කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට පත්වීම් බලධරයාට බලය ඇත.

**05. වැටුප් ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු:82,150-10x2,400-8x2,940–17x3,900–1,95,970/- (SL–1–2025) වන අතර එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් ඉහත චක්‍රලේඛයේ උපලේඛන III අනුව වැටුප් ගෙවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

**06. බඳවා ගැනීමේ සුදුසුකම් :**

6.1 අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා වයස් සීමාව :

6.1.1

(i.) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි ඇතුළත් විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් පස් අවුරුදු වාස්තු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii.) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි ඇතුළත් විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම;

*හෝ*

(iii.) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි ඇතුළත් විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම;

*සහ*

ඉහත සුදුසුකම් සපුරා ඇති රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි MN 2 හෝ ඊට ඉහළ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධාරීන්

I. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ සම්මත පාඨමාලාව -1 කොටස සමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරීන්;

*සහ*

II. පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සහිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ සැලසුම් ශිල්පීන්.

6.1.2 වයස් සීමාව : අදාළ නොවේ.

6.2 වෙනත් සුදුසුකම් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම;
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;

iii. ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මෙන්ම තම තනතුරේ භූමිකාව හා කාර්යයභාරය හොඳින් ඉටුකිරීමට අවශ්‍ය ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම;

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය;

v. සේවයේ ස්ථිර කර තිබීම;

vi. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත්කරන දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**07. බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත**

7.1 ලිඛිත විභාගය : මෙම තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ.

| *අංකය* | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|---|
| 01 | වාස්තු විද්‍යා විෂයානුබද්ධ දැනුම | 100 | 40 | පැය 03 |
| 02 | පොදු ප්‍රශ්න පත්‍රය | 100 | 40 | පැය 02 |

සියළු අපේක්ෂකයන් මෙම විභාගය සඳහා නියමිත ප්‍රශ්න පත්‍ර 02 සඳහාම පෙනී සිටිය යුතුය.

විෂය අංක 01 - වාස්තු විද්‍යා විෂයානුබද්ධ දැනුම

මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් පරිදි සකස් වේ.

කාලය පැය තුනයි.

I හා II කොටස්වලින් අනිවාර්යය ප්‍රශ්න දෙකකට ද (ලකුණු 20 බැගින්) අනෙක් කොටස් තුනේ ප්‍රශ්න 6 න් හතරකට ද පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 15 බැගින්)

I කොටස - රාජ්‍ය අංශයේ වාස්තු විද්‍යාඥයකුගේ ප්‍රායෝගික භූමිකාව

1. රාජ්‍ය අංශය හා පුද්ගලික අංශය අතර වාස්තු විද්‍යා පරිචයෙහි වෙනස.
2. වාස්තු විද්‍යාඥ භූමිකාවේ පරාසය වාසි සහ අවාසි.
3. ජනතාව කෙරෙහි වන වගකීම්.
4. සංවිධානය කෙරෙහි වන වගකීම්.

II කොටස -

1. මූලික අධ්‍යයනයන් හා විමර්ශන.
2. සංකල්පමය නිර්මාණය හා මූලික ඇස්තමේන්තු සඳහා වන ප්‍රවේශය.
3. රීති සැලසුම්කරණය හා ගොඩනැගීම සහ අවශ්‍ය අනුමැතීන් හා පැහැදිලි කිරීම් ලබාගැනීම.
4. අදාළ පළාත් පාලන ආයතනයෙන් අනුමැතිය ලබාගැනීම සඳහා සකස් කළ යුතු සැලසුම් කට්ටලය.
5. වාස්තු විද්‍යාත්මක විස්තරාත්මක ක්ෂේත්‍ර සැලසුම් සහ පිරිවිතර.
6. අනෙකුත් උපදේශකවරුන් (ව්‍යුහ සැලසුම් සහ සේවා සැලසුම්) සමඟ සම්බන්ධීකරණයෙන් විස්තරාත්මක දත්ත සකස් කිරීම.

III කොටස - සංවිධානයේ කාර්යයන් සහ මෙහෙයුම් මාධ්‍යය

1. සංවිධානයේ දැක්ම හා මෙහෙවර.
2. සංවිධානයේ භූමිකාව හා කාර්යයන්.
3. සංවිධාන ව්‍යුහය.
4. සංවිධානයේ කාර්යයන් ඉටු කිරීමේදී එහි එක් එක් අංශයෙහි රාජකාරි හා වගකීම් හා අන්තර් සම්බන්ධතා.
5. අනෙක් රාජ්‍ය ආයතන සමඟ ඇති සම්බන්ධතා.

IV කොටස - ව්‍යාපෘතියේ පූර්ව ඉදිකිරීම් අවධිය තුළ ව්‍යාපෘතියට වාස්තු විද්‍යාඥයාගේ දායකත්වය

1. ලන්සු ලියකියවිලි හා ආයතන ඇස්තමේන්තු.
2. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ.
3. පූර්ව ටෙන්ඩර් රැස්වීම් හා ටෙන්ඩර් කටයුතු.
4. තාක්ෂණික ඇගයුම් හා ටෙන්ඩර් මණ්ඩල වර්ග.
5. ගිවිසුම් හා කොන්ත්‍රාත් පිරිනැමීම.

V කොටස- ව්‍යාපෘති ක්‍රියාත්මක ක්‍රියාවලිය තුළ හා පසු කොන්ත්‍රාත් අවධිය තුළ වාස්තු විද්‍යාඥයාගේ දායකත්වය.

1. වැඩ බිමෙහි ප්‍රගති සමාලෝචන රැස්වීම්.
2. තත්ව පාලන ක්‍රියාපරිපාටි.
3. ඉදිකිරීමේ කණ්ඩායම සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම.
4. නිර්මිත පරිසරය තක්සේරු කිරීම හා පශ්චාත් විශ්ලේෂණ කටයුතු.
5. නඩත්තු අත්පොත්.

විෂය අංක 02 - පොදු ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය පැය 02 කට සීමා කෙරේ. ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි.

I කොටස: සියලුම විෂයයන් ආවරණය වන සේ පුළුල් විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් වූ ප්‍රශ්නවලින් යුක්ත වේ.
II කොටස: ආර්ථික, දේශපාලනික, සංස්කෘතික සහ කලාව වැනි අනෙකුත් සාමාන්‍ය විෂයයන් සම්බන්ධයෙන් වූ ප්‍රශ්නවලින් සමන්විත වේ.
ප්‍රශ්න පත්‍ර ව්‍යුහය :

- ඉහත ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න බහුවරණ හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න හෝ ඒවායේ සංකලනයෙන් යුක්ත විය හැක.
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

7.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

ලිඛිත විභාගයේ එක් එක් විෂය සඳහා 40% හෝ ඊට ඉහළ ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගන්නා ප්‍රමාණය මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයන්ට ලබාදෙන ලකුණු ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණුවලට එකතු කළ විට ලැබෙන මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පහත පරිදි ලකුණු ලබා දීම හා සුදුසුකම් පරීක්ෂා කිරීම කරනු **ලැබේ.**

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *මුළු ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | | 20 |
| | I. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පශ්චාත් උපාධියක් | 10 | |
| | II. | පූර්ණ වෘත්තීය සුදුසුකම | 10 | |
| **2.** | **අතිරේක වෘත්තීය සුදුසුකම්** | | | 20 |
| | I. | වර්තමාන සේවා ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රකාශන (ඒවා පළ කරන ලද මාධ්‍යයන් සහ **ISBN** අංක ලබා තිබේ ද යන්න සනාථ කළ යුතු ය - එකකට ලකුණු 01 බැගින්) | 05 | |
| | II. | වර්තමාන සේවා ක්ෂේත්‍රයට අදාළව දේශීය/ විදේශීය පිළිගත් ආයතනයන්හි දරනු ලැබූ තනතුරු (අදාළ සේවා සහතික ඉදිරිපත් කළ යුතුය - එකකට ලකුණු 01 බැගින්) | 05 | |
| | III. | වර්තමාන සේවා ක්ෂේත්‍රය තුළ ලද සම්මාන/ ප්‍රශංසා (පොදු 230 ආකෘති පත්‍ර මඟින් හෝ පිළිගත හැකි සහතික පත්‍ර මඟින් සනාථ කළ යුතුය - එකකට ලකුණු 01 බැගින්) | 05 | |
| | IV. | සේවා ක්ෂේත්‍රයට අදාළව කරනු ලැබූ නව නිපැයුම් ( නව නිපැයුම් ලෙස පිළිගනු ලැබූ ආයතන මඟින් නිකුත් කළ සහතිකය ඉදිරිපත් කළ යුතුය - එකකට ලකුණු 01 බැගින්) | 05 | |
| **3.** | **වෘත්තීය පළපුරුද්ද** | | | 55 |
| | I. | තනි ගොඩනැගිලි සම්බන්ධ වාස්තු විද්‍යාඥ කාර්යයන්<br>- නිවාස<br>- පොදු කාර්යාල<br>(වර්ග අඩි 300 සිට 500 දක්වා නිවාස හා රජයේ පොදු කාර්යාල ගොඩනැගිලි) | 15 | |

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | | | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| | II. | අර්ධ මහල් ගොඩනැගිලි සම්බන්ධ වාස්තු විද්‍යාඥ කාර්යයන්<br>- නිවාස යෝජනා ක්‍රම<br>- මිශ්‍ර සංවර්ධන ගොඩනැගිලි<br>(තට්ටු 2 සිට 5 දක්වා) | 10 | |
| | III. | උස ගොඩනැගිලි සම්බන්ධ වාස්තු විද්‍යාඥ කාර්යයන්<br>- නිවාස යෝජනා ක්‍රම<br>- මිශ්‍ර සංවර්ධන ගොඩනැගිලි<br>(තට්ටු 6 ට වැඩි මහල් ව්‍යාපෘති) | 10 | |
| | IV. | ජනාවාස හා ප්‍රධාන ව්‍යාපෘති සැලසුම්<br>- නිවාස යෝජනා ක්‍රම<br>- **Master Plan**<br>- මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති | 10 | |
| | V. | වෙනත්<br>- අමතර නිර්මාණ (උදා-: ප්‍රදර්ශන භූමි)<br>- සමාජ සේවා දායකත්වය<br>- **Housing Clinic**<br>- වෘත්තියට අදාළව වෙනත් අධ්‍යාපන පාඨමාලා හදාරා තිබීම (උදා-: හරිත ගොඩනැගිලි)<br>(ඉහත කරුණු සනාථ කිරීම සඳහා පිළිගත හැකි සහතික ද ඉදිරිපත් කළ යුතුය.) | 10 | |
| **4.** | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව** | | | 05 |
| **මුළු ලකුණු** | | | | **100** |

7.3 තනතුරට අදාළවන පරිදි ලිඛිත විභාගයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත තනතුර සඳහා පත්කිරීම් කරනු ලැබේ.

කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම්ලත් අපේක්ෂකයන් සිටී නම් හා එම පුරප්පාඩු පිරවීමේ සේවා අවශ්‍යතාවක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් අතුරින් වැඩිදුර තෝරා ගැනීමක් සිදු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරා ගැනීමේ පටිපාටිය පහත පරිදි කොටස් දෙකකින් යුක්ත ය.

I. අපේක්ෂකයන්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය
II. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

ලිඛිත පරීක්ෂණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පැවැත්වෙනු ඇත.
සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

මෙම තෝරාගැනීමේ පටිපාටියේ ව්‍යුහය හා අන්තර්ගතය පිළිබඳ වැඩිදුර තොරතුරු www.psc.gov.lk හි රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පහත වෙබ් පිටුවේ පළ කර ඇත.

මුල් පිටුව ⟶ බාගත කිරීම් ⟶ ක්‍රියා පටිපාටි ⟶ විශේෂ තෝරා ගැනීමේ පටිපාටිය

7.4 තනතුර සඳහා පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. අදාළ තනතුරු සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ පදනම් කරමින් පත්වීම් සිදු කරනු ලැබේ. තනතුරෙහි පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ නොපිරවීමට හෝ පුරප්පාඩුවලින් යම් කොටසක් පිරවීමට හෝ නොපිරවීමට හෝ පත් කිරීම් බලධරයාහට බලය ඇත.

7.5 පත්වීම් බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු /මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

7.6 විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

**08. විභාග කොන්දේසි :**

8.1 විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගය සඳහා තමා විසින් අයදුම්කරනු ලබන තනතුරට අදාළ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

8.2 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම්කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instruction) භාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් නිවැරදිව පිළිපදින්න. මාර්ගගතව යොමු කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන එහි අයදුම්කරුගේ අත්සන සහතික කිරීම සහ රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ පරිදි ආයතන ප්‍රධානියාගේ සහතිකය ද සටහන් කරගෙන ළඟ තබා ගත යුතු ය. එම සහතික කරන ලද මුද්‍රිත පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත කැඳවන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු වේ. අයදුම්පතේ පිටපතක් ලබා ගැනීම සඳහා පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8.3 මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 1200/= කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the facility of internet transaction);
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / Flex යෙදවුම (Online Banking Method/ Flex App of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the bank of Ceylon);

*සටහන :* ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් www.doenets.lk වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන නියමිත මුදල ම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් මත ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.

8.4 අයදුම්කරු ළඟ තබා ගන්නා අයදුම්පතේ මුද්‍රිත පිටපතෙහි සහ විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ

අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. රජයේ සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

8.5 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දැනුම් දෙනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායීවනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී/ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

*සටහන :* ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකමක් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8.6 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

8.7 විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය;

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කරගත හැකි වන පරිදි මුහුණු ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරුකර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන්ව ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**09.** **සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇති බව පත්වීම් ලබා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ පත්වීම අවලංගු කරන අතර අදාළ පත්වීම යටතේ වැටුප් හා දීමනා ලෙස රජය/ පළාත් සභා විසින් ගෙවා ඇති සියලු මුදල් අයකර ගනු ලැබේ.

**10.** **විභාග මාධ්‍යය :**

i. විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යන්ගෙන් පවත්වනු ලැබේ.

ii. විභාගයට පෙනී සිටින මාධ්‍ය පත්වීම් මාධ්‍ය ලෙස සලකනු ලැබේ.

iii. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

iv. තම අයදුම්පතෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

**11.** මෙහි විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පත්කිරීම් බලධරයා සතු වේ.

**12**. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර,**
**ලේකම්,**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ**
**පළාත් පාලන අමාත්‍යාංශය.**

**2026 ජුනි මස 15 දින,**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,**
**නිදහස් චතුරශ්‍රය,**
**කොළඹ 07.**

**06 - 396**

---

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි තනතුරේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026**

ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු පනස් අට (58) ක් සම්පූර්ණ කිරීම සඳහා පහත 02 හි සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** **බඳවා ගැනීමේ ක්‍රමවේදය -**
අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි තනතුරෙහි පවතින පුරප්පාඩු, පහත 02 හි සුදුසුකම් සම්පූර්ණ කළ තැනැත්තන් ලිඛිත පරීක්ෂණයකට හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එහි ප්‍රතිඵල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් පුරවනු ලැබේ.

**02.** **සුදුසුකම් :-**

**I.** **අධ්‍යාපන සුදුසුකම්** - ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව සහ කෘෂි තාක්ෂණවේදය යන විෂයන් අතුරින් විෂයන් තුනකින් (03) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය එකවර සමත් වීම;

*සහ*

සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

**II.** **වෘත්තීය සුදුසුකම් -** තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දැවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**III.** **කායික සුදුසුකම් -** ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**IV.** **වෙනත් සුදුසුකම් -**

- අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලුම සුදුසුකම්, *ගැසට් නිවේදනයේ* සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**03.** **වැටුප් පරිමාණය සහ කාණ්ඩය -**

මෙම තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය: රු.52,250-10×800-11×1,190-10×1,320-10×1,350-රු. 100,040/-
**වැටුප් කේත අංකය** - MN3 – 2025

**04.** **වයස් සීමාව -**

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව

2008.07.31 දිනට හෝ ඊට පෙර හා 1996.07.31 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

**05. සේවා කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට බඳවා ගන්නා අයදුම්කරුවන් යටත් වනු ඇත.

II. මෙම තනතුරට පත්කරනු ලබන අය අවුරුදු තුනක (03ක) පරිවාස කාලයකට යටත් වනු ඇත.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර තුනක් (03) ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු වේ.

IV. ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි සන්ධාන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතු ය.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික නීතිරීති වලට ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාවට හා ඊට සිදු කර ඇති හා සිදු කරනු ලබන සංශෝධනයන්හි කොන්දේසිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, කලින් කල ආණ්ඩුව නිකුත් කරන වෙනත් රෙගුලාසිවලට ද, මෙම පත්වීම යටත් ය.

**06. විභාග ක්‍රමය :**

I. මෙම විභාගය ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන අතර එම ආයතනයේ ප්‍රධානියා විසින් තීරණය කරනු ලබන දිනයක දී කොළඹ නගරයේ දී පමණක් විභාගය පවත්වනු ලැබේ.

II. විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

III. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්නවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.

**07. ලිඛිත පරීක්ෂණයේ දී විෂය නිර්දේශය :**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තාර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණ කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වන මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට ගැලපෙන ප්‍රශ්නවලින් යුක්ත ය.<br>(කාලය පැය 01 - මුළු ලකුණු 100) |
| 2.විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය හා එහි විකාශය, ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපාර, ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය සහ ජනාවාස සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ ව්‍යුහගත රචනා ශෛලියේ ප්‍රශ්න පත්‍රයකි. පහත විෂයයන් පිළිබඳ සරල අවබෝධයක් අපේක්ෂකයන්ගෙන් බලාපොරොත්තු වේ.<br>(කාලය පැය 03 යි - මුළු ලකුණු 100)<br><br>**i. ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය සහ එහි විකාශය**<br><br>- ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය පිළිබඳ ඉතිහාසය.<br>- ලේඛන ලියාපදිංචි කිරීම මගින් ඉඩම් අයිතිය තහවුරු කිරීම.<br>- ශ්‍රී ලංකාවේ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම. |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 2.විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | **ii.** **ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපාර**<br>- බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් හඳුන්වාදුන් මුඩුබිම් ආඥා පනත සහ එමඟින් ඇති වූ සමාජ වෙනස්කම්.<br>- 1935 දී ඉඩම් සංවර්ධන ආඥා පනත ආරම්භ වීම සහ ගොවි ජනතාවට ඉඩම්වල අයිතිය ලබා දීම.<br>- 1972 දී හඳුන්වාදුන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත සහ එමඟින් ඇති වූ ඉඩම් ප්‍රතිසංස්කරණය.<br><br>**iii.** **ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය**<br>- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති<br>- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාර බෝග නිෂ්පාදනය සහ ආහාර සුරක්ෂිතභාවය.<br>- ඉඩම් සංවර්ධනය මඟින් ඉඩම් සංවර්ධනය සහ සංරක්ෂණය<br>- ශ්‍රී ලංකාව තුළ ජාතික නිෂ්පාදනයේදී කෘෂිකර්මාන්තයේ දායකත්වය<br>- බෝග විවිධාංගීකරණය<br>- ජල පාලනය<br>- පාංශු සංරක්ෂණය<br><br>**iv.** **ජනාවාස සැලසුම්කරණය සහ කළමනාකරණය**<br>- ජනාවාස සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ මූලික අංග<br>- සමාජ ආර්ථික සමීක්ෂණ<br>- නැවත පදිංචි කිරීම<br>- ප්‍රජා සංවර්ධනය<br>- මූලික යටිතල පහසුකම් සංවර්ධනය |

**08. සම්මුඛ පරීක්ෂණය -**

ලිඛිත පරීක්ෂණයේ දී එක් එක් විෂයට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කෙරේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමක් සිදුනොවන අතර, අයදුම්කරුවන්ගේ සහතිකපත්‍ර හා භෞතික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

**09. විභාග ගාස්තු -**

මෙ සඳහා විභාග ගාස්තුව රු. 500.00 ක් වන අතර, විභාග ගාස්තුව **"ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව"** නමින් බත්තරමුල්ල ලංකා බැංකු ශාඛාවේ ඇති ගිණුම් අංක **7042571** දරන ගිණුමට බැර වෙන පරිදි ඉල්ලුම් පත්‍රය භාරගන්නා අවසන් දිනට ප්‍රථම දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවීම් කර ලබාගත් ලදුපත තම ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අය කිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසා සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇත.

**10. අයදුම්පත් ඉදිරිපත් කිරීම -**

(අ) අයදුම්පත්‍රයේ අංක 01 සිට 04 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය අනෙකුත් පිටුවලට ද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිළිව සම්පූර්ණ කළ යුතු වේ. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු වේ. එසේම නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ

අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය *ගැසට්* නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතු ය. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) මෙම නිවේදනයට යා කොට ඇති ආකෘතිය ප්‍රකාරව පිළියෙල කරන ලද ඉල්ලුම්පත **2026 ජූලි මස 31 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,"මිහිකත මැදුර", අංක 1200/06, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතු ය**. මෙදිනට පසු ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඇ) ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි තනතුරේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026"** යනුවෙන් පැහැදිලිව සඳහන් කිරීම අනිවාර්ය වේ.

(ඈ) අත්සන සහතික කිරීමට බලයලත් තැනැත්තකු විසින් අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු ලවා ද අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥවරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රජයේ පාසලක විදුහල්පතිවරයෙකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු යන අය අතරින් කවරෙකු හෝ ලවා සහතික කරවාගත යුතු ය.

**11.** විභාගයට ඇතුලත් කර ගැනීම -

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාල ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාගය පවත්වනු ලබන ආයතනයේ ප්‍රධානියා විසින් ප්‍රවේශ පත් නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ www.landcom.gov.lk වෙබ් අඩවියෙහි දැන්වීමක් පළ කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් එම දැන්වීමෙහි සඳහන් ආකාරයට ඒ පිළිබඳව විමසීම කළ හැකි ය. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් වෙතොත් ඔහුට/ ඇයට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

(ආ) විභාග අයදුම්කරුවන්ගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් පමණකි.

**i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;**

**ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.**

**12.** විභාග ප්‍රතිඵල -

මෙම නිවේදනයේ 07 ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා ලද අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතා අනුපිළිවෙළට සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනය විභාගය පවත්වනු ලබන ආයතනයේ ප්‍රධානියා විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට විභාගය පවත්වනු ලබන ආයතන ප්‍රධානියා විසින් පියවර ගනු ඇත.

**13.** අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

**14.** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාගය පවත්වනු ලබන ආයතනයේ ප්‍රධානියා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය

කලහොත් විභාගය පවත්වන ආයතනයේ ප්‍රධානියා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ ඇයට සිදු වනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාගය පවත්වන ආයතනයේ ප්‍රධානියාගේ තීරණය අවසන් තීරණය වේ.

**15.** අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

**16.** මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිළි කිරීමේ / තීරණ ගැනීමේ අයිතිය ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා සතුය.

**17.** මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර,කිසියම් අනනුකූලතාවයක් හෝ නොගැලපීමක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**චන්දන රණවීර ආරච්චි,**
ඉඩම් කොමසාරිස් ජනරාල්.

2026 ජුනි මස 17 වැනි දින,
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දී ය.
1200/6, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි තනතුරේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026**

**Open Competitive Examination for Recruitment to Grade III of the post of Colonization Officer in Supervisory Management Assistant Technological Service Category of Land Commissioner General`s Department -2026**

| |
|---|
| |

කාර්යාල ප්‍රයෝජනය සඳහා

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 06 වන ඡේදයට අනුව විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
( ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

සිංහල - 1
දෙමළ - 2 [ ]

(අදාල අංකය කොටුව තුල ලියන්න)

**01. නම :**

1.1 මුලකුරු සමග නම Mr./Mrs./Miss.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා - GUNATHILAKA B.M.I.S
.............................................................................................................................................
..............................................................................................

1.2 සම්පූර්ණ නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):-
.............................................................................................................................................
..............................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්):-
.............................................................................................................................................
..............................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**02.** ලිපිනය:-

2.1 ස්ථිර ලිපිනය :- (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්))
.............................................................................................................................................
.............................................................................................................

2.2 ස්ථිර ලිපිනය :- (සිංහලෙන්/දෙමළෙන්)
.............................................................................................................................................
.............................................................................................................

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :- (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
.............................................................................................................................................
.............................................................................................................

2.4 දුරකතන අංකය :- ජංගම ................................. ස්ථාවර ............................................

**03. ස්ත්‍රී/ පුරුෂ භාවය** :- (√ ලකුණ යොදන්න)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

3.1. උපන් දිනය :-

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.2 අයදුම්පත් කැඳවන දිනට වයස :-

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

**04.** අයදුම්කරු අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය : - .....................................................................

4.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:- ......................................................................................
4.2 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :- ......................................................................................

**05.** **අධ්‍යාපන සුදුසුකම් :**

5.1 අ.පො.ස.( සා/පෙළ) විභාගය

විභාග අංකය :-............................ වර්ෂය :-................

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

5.2 අ.පො.ස ( උ.පෙළ) විභාගය : විභාග අංකය :........................ වර්ෂය :..................

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

5.3 වෘත්තීය සුදුසුකම්:-

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාලසීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

**06. පරිගණක සාක්ෂරතාවය** :-...........................................................................................

**07. වෙනත් සුදුසුකම්** :- ……………………………………………………………………………………………..
.

**08. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?**

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න, ඔව් නම් විස්තර පහත සඳහන් කරන්න)
...............................................................................................................................

**09. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර. :**

I. විභාග ගාස්තු ගෙවූ බැංකුව - ................................ ශාඛාව - .........................................
II. ගෙවූ දිනය - ............. ../............./......... ගෙවූ මුදල - ..........................................

**විභාග ගාස්තු ගෙවන ලද ලදුපත මෙහි නොගැලවෙන ලෙස අලවන්න.**

**10. අයදුම්කරුගේ ප්‍රකාශය:**

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ප්‍රකාශ කරමි.මෙම අයදුම්පතේ යම් තොරතුරක් හෝ තොරතුරු කිහිපයක් සම්පූර්ණ නොකිරීමෙන් හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වේ. තව ද මේ සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවටද ප්‍රකාශ කරමි.විභාගයේ සියලුම කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි. විභාගය පවත්වන ආයතනයේ ප්‍රධානියා, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවට ද ප්‍රකාශ කරමි.

මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

දිනය .......................... ...........................,
අයදුම්කරුගේ අත්සන.

**11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ............................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ ඇය මා ඉදිරිපිට දී .................................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

දිනය ..........................

....................................
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :- ...........................................................
තනතුර :-............................................................
ලිපිනය :- ...........................................................
(නිල මුද්‍රාවකින් සනාථ කරන්න)

**12. ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

ඉහත තොරතුරු සඳහන් .................................................................... මයා/මිය/මෙනවිය දැනට මෙම කාර්යාලයේ සේවය කරන බවද, ඔහුගේ /ඇයගේ සේවය සතුටුදායක බවද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව තෝරා ගනු ලැබුවහොත් ඔහු /ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි / නොහැකි බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද, සහතික කරමි.

දිනය :-...............................

ආයතන ප්‍රධානියාගේ නම :- ...........................................................
තනතුර :-............................................................
ලිපිනය :- ...........................................................
(නිල මුද්‍රාවකින් සනාථ කරන්න)

........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

06 - 399

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.